# අනුරාධපුර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසල් ආශ්‍රිත පන්ති කාමර කළමනාකරණය පිළිබඳ අධ්‍යයනයක්

කේ. එස්. කේ. පීරිස්

විද්‍යාවේදී (පේරාදෙණිය), අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ)

UCLIB
472800

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ අවශ්‍යතාවක් ඉටු කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ කෘතියයි.

1998

## සාරාංශය

වසර කිහිපයක් මුළුල්ලේ පන්ති කාමර ඉගැන්වීමේ අත්දැකීම් ඇති පර්යේෂකයා අනුරාධපුර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ පාසල් ආශ්‍රිත ව පන්ති කාමර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනය සංඛ්‍යාන විද්‍යානුකූල ව කිරීම කාලෝචිත ය.

පළමු පරිච්ඡේදයේ දී අධ්‍යයනය හා එයට පසුබිම් වූ හේතු දක්වා අධ්‍යයන අරමුණු ඉදිරිපත් කර ඇත. එම අධ්‍යයන අරමුණු පහත දැක්වේ.

1. පන්ති කාමර කළමනාකරණය පිළිබඳ ගුරුභවතුන්ගේ න්‍යායික දැනුම තක්සේරු කිරීම.

2. පන්ති කාමර කළමනාකරණයට බලපාන සාධක ලෙස ගුරුභවතුන් සංජානනය කරන්නේ කුමක් දැයි සුවිශේෂ ව හඳුනා ගැනීම.

3. පන්ති කාමර කළමනාකරණයට බලපාන සාධක ලෙස ශිෂ්‍යයින් සංජානනය කරන්නේ කුමක් දැයි සුවිශේෂ ව හඳුනා ගැනීම.

4. පන්ති කාමර කළමනාකරණ ගැටළු සුවිශේෂ ව හඳුනා ගැනීම.

5. පන්ති කාමර කළමනාකරණ පිළිවෙත් හා ක්‍රමෝපායන් සුවිශේෂ ව හඳුනා ගැනීම.

6. පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලිය, කළමනාකරණයේ පද්ධති න්‍යාය ඇසුරින් විග්‍රහ කිරීම ද වේ.

මෙම පරිච්ඡේදයේ දී පන්ති කාමරයේ වැදගත්කම හා පන්ති කාමර කළමනා-කරණයේ වැදගත්කම ද, අධ්‍යයනයේ වැදගත්කම ද විමසා ඇත. පර්යේෂණය සාර්ථක ව

කරගෙන යාමට අවශ්‍ය ක්‍රියා මූල නිර්වචන සියල්ල ම ද, අධ්‍යයනයේ සීමාවන් ද දක්වා පළමු පරිච්ඡේදය සමාප්ත කර ඇත.

දෙවැනි පරිච්ඡේදයේ දී පර්යේෂණය සාර්ථක කර ගෙන යාමට අවශ්‍ය පර්යේෂණ සාහිත්‍ය ගැන විමසා ඇත. ඒ යටතේ 'පන්ති කාමරය' පිළිබඳ ව වන නිර්වචනයන් ද ඉන් අනතුරුව 'පන්ති කාමර කළමනාකරණය' පිළිබඳ විදුහුරු නිර්වචන ද විමසා ඇත. පන්ති කාමර කළමනාකරණය සංජානනය කරනු ලබන ආකාරය පිළිබඳ ව සාහිත්‍ය විමසීමෙන් අනතුරුව පන්ති කාමර කළමනාකරණ ගැටළු පිළිබඳ ව නිර්වචනයන් ද එම ගැටළු සඳහා හේතූන් ද විමර්ශනය කර ඇත. එයටත් පසුව පන්ති කාමර කළමනාකරණ ශිල්පි ක්‍රම පිළිබඳ විවිධ තොරතුරු විමසා ඇත. අවසාන වශයෙන් පද්ධති න්‍යාය පිළිබඳ ව මූලික ලක්ෂණයන් ද ඉදිරිපත් කර දෙවැනි පරිච්ඡේදය සමාප්ත කර ඇත.

තුන් වෙනි පරිච්ඡේදයේ දී පර්යේෂණ උපකරණ සකස් කරන ලද ආකාරය ගෙන හැර දක්වා ඇත. ඒවා සිසු-සිසුවියන් 929 කට දෙන ලද ප්‍රශ්නාවලියකින් ද, ගුරුභවතුන් 120 දෙනෙකුට දෙන ලද ප්‍රශ්නාවලි පහතින් සහ නිරීක්ෂණ තොරතුරු වාර්තා කිරීමේ උපකරණයකින් ද සමන්විත ය. මෙම උපකරණ භාවිතා කරන ලද ආකාරය ද, එයට පසුව ඒවා මගින් ලබා ගන්නා ලද දත්ත ඉදිරිපත් කරනු ලබන ආකාරයත් දක්වා ඇත. එයටත් පසුව ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණය කරනු ලබන ආකාරයත්, පර්යේෂණ සීමාවනුත් ගෙන හැර දක්වා තුන් වෙනි පරිච්ඡේදය සමාප්ත කර ඇත.

සිව් වෙනි පරිච්ඡේදයේ දී දත්ත විශ්ලේෂණය කර ඇති අතර ඒ සඳහා ප්‍රතිශත භාවිතය, දර්ශකාංක භාවිතය හා විසැලි විශ්ලේෂණය ද උපයෝගී කර ගෙන ඇත. විසැලි විශ්ලේෂණයේ දී සියයට පහ මට්ටම සියලු කටයුතු සඳහා අදාළ කර ගෙන ඇති අතර, දීර්ඝ ලෙස එකම ආකාරයේ ගණනයන් නැවත-නැවතත් කිරීමෙන් වළකිනු පිණිස පර්යේෂකයා ම සකස් කරන ලද පරිගණක ප්‍රකමණයක් උපයෝගී කර ගෙන ඇත. සංඛ්‍යාන විශ්ලේෂණ ප්‍රතිඵලයන් අදාළ ස්ථානවල ම සඳහන් කරමින් සිව් වෙනි පරිච්ඡේදය සමාප්ත කර ඇත.

සිව් වෙනි පරිච්ඡේදයේ දී සංඛ්‍යාන විශ්ලේෂණ මගින් ලබා ගන්නා ලද ප්‍රතිඵලයන් ගැන අර්ථකථනයන් පස් වෙනි පරිච්ඡේදයේ දී කරන පර්යේෂකයා අදාළ ස්ථානයන් හි දී හේතු සූක්ෂ්ම ව විමසා ඇත. මෙහි දී පර්යේෂණ සාහිත්‍ය ගැන ද මැනැවින් විමසා, දත්ත විශ්ලේෂණය කරන ලද අනුපිළිවෙල යටතේ ම අර්ථකථනයන් ද කර ඇත. අවසානයේ දී අනාවරණයන් සියල්ල ම සමස්තයක් ලෙස සලකා බැලීමක් කිරීමෙන් පන්ති කාමර කළමනාකරණය විග්‍රහ කිරීමට 'පද්ධති න්‍යාය' මැනැවින් ආධාර කර ගත හැකි බව දක්වා ඇත.

අනුරාධපුර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසල් ආශ්‍රිත පන්ති කාමර කළමනාකරණය පිළිබඳ විස්තරාත්මක අධ්‍යනයෙන් හෙළි කරන නිගමන සියල්ල ම හය වෙනි පරිච්ඡේදයේ දී දක්වා ඇත. වඩාත් හොඳ පන්ති කාමර කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා යෝජනා ද ඉදිරිපත් කරමින් අනාගත පර්යේෂණ් සඳහා ද ඉඟි දක්වා හය වෙනි පරිච්ඡේදයේ දී පර්යේෂණ කෘතිය සමාප්ත කර ඇත.